**බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023**

බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023 සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 2023.08.11 දිනැති පළාත් සභා ගැසට් පත්‍රයේ පළ කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරුණු මනාව අවබෝධ කර ගැනීමෙන් අනතුරුව www.psc.wp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස, මාර්ගගත ක්‍රමය මගින් අයදුම්පත් 2023.08.25 දිනට ප්‍රථම යොමු කිරීම සිදු කල යුතුය.

03. නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව 2023.09.01 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " ලේකම්, බඳවාගැනීම් ශාඛාව, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නො 628, 10 වන මහල, ජනජයසිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ.
- මාර්ග ගත ක්‍රමය ඔස්සේ අයදුම්කර (Online) බාගත කර (Download) නොගන්නා ලද අයදුම්පත් හා පරිගණකය මගින් සකස් කර මුද්‍රණය කර ගන්නා ලද අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.
- අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.
- සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි ඡායාපිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.
- අයදුම් කරනු ලබන විෂයය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.
- අයදුම්පත සමඟ කිසිදු සහතිකයක් අමුණා නොඑවිය යුතුය. මුදල් ගෙවීම කළ බවට කුවිතාන්සියේ මුල් පිටපත පමණක් <u>අලවා එවිය යුතුය</u>. (<u>අමුණා එවීම නොකළ යුතුය</u>.)

04. අයදුම්පතෙහි අයදුම්කරනු ලබන විෂයය සඳහන් කිරීමේදී, රජයේ ගැසට් පත්‍රයේ උපලේඛණ 01 යටතේ සඳහන් කර ඇති දැනට පවතින පුරප්පාඩු හා මාධ්‍ය පිළිබඳ විස්තර අනුව අදාළ විෂයය තෝරා ගැනීම සිදු කළ යුතුවේ.

**<u>05. දමිළ මාධ්‍ය අයදුම්කරුවන් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් මාර්ගගතව අයදුම්පත සම්පූර්ණ කිරීමේ පහසුකම සළසා ඇත.</u>**

06. දැනට රාජ්‍ය සේවයේ තනතුරක සේවය කරන අයදුම්කරුවෙකු නම් අයදුම්කරු විසින් අයදුම්පතේ අංක 17 යටතේ සඳහන් තොරතුරු අනිවාර්යයෙන් සම්පූර්ණ කලයුතු අතර, දැනට රාජ්‍ය සේවයේ තනතුරක සේවය නොකරන අයදුම්කරුවන් අයදුම්පතේ අංක 18 යටතේ සඳහන් තොරතුරු <u>පමණක්</u> සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

**Open Competitive examination for the Recruitment of Graduates to Grade 3- 1(a) of the Sri Lanka Teachers' Service for Sinhala, Tamil and English medium Vacancies in Western Provincial Schools – 2023**

Applications are hereby called from qualified applicants for the open competitive examination- 2023, to recruit for the Grade 3- 1(a) of the Sri Lanka Teachers' Service for Sinhala, Tamil and English medium teacher vacancies in Western Provincial schools.

02. Applicants are advised to read the **Notice** thoroughly published in the Provincial Council Gazette dated 11.08.2023 and submit the application **online** via the official website, www.psc.wp.gov.lk.

03. A printed copy of the duly completed application should be signed by the applicant and attesting the signature, forward the same by registered post to reach "Secretary, Recruitment Branch, Provincial Public Service Commission (Western Province), No.628, 10 th floor, Jana Jaya City building, Nawala road, Rajagiriya." on or before 01.09.2023.

- Applications which are received after the closing date shall not be accepted.
- Applications which are not downloaded after applying via online and applications which are prepared and printed by computer shall be rejected without any notice.
- Incomplete applications and applications that do not fulfill the basic qualifications shall be rejected without any notice.
- A copy of the completed application should be kept in hand for any further inquiry.
- Applied subject shall not be changed under any circumstances. An applicant can submit only one application.
- No any certificate shall be attached along with the application. Only the original copy of the pay slip shall be pasted to the application. (Do not attach).

04. In the event of mentioning the subject in the application, the subject should be selected as per the details of existing vacancies and medium mentioned under the schedule 01 of the Gazette notification.

05. Tamil medium applicants can fill the application online in English medium.

06. Applicants who are serving in the public service should complete the details mentioned under no. 17 of the application. Other applicants may only complete the details mentioned under no.18 of the application.

Thilak Senarath
Secretary
Provincial Public Service Commission
Western Province